වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් නොවන වාහන හතරක වටිනාකම් එකතුව රු.3,082,000 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාවට අයත් වාහන තුනක වටිනාකම පසුගිය වසර 02 සිට වසර 15 ක් පුරාම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.576,000 ක පිරිවැයකට මිලටගත් වාහනයක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපළ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
--------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ විසින් ග්‍රාමීය ප්‍රාදේශවල කිලෝමීටර් 1000 ක් දුරට මාර්ග යළි ඉදිකිරීමේ යෝජනා ක්‍රමයට අනුව,රුපියල් මිලියන 6 ක් වටිනා කමැති මලවර්යාර් මාර්ගයේ යළි ඉදිකිරීම්

වැඩ 2017 නොවැම්බර් 20 දින නිමකර තිබුණි. එසේවුවද, මේ දක්වාම රු.2,162,052 ක මුදලක් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාගෙන නොතිබු නිසා එකී මුදල කොන්ත්‍රාත්කරුට නිරවුල් කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු මුදල්

--------------------

විවිධ ණය හිමි ගිණුමේ රු.142,600 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. එසේ වුවද, එකී මුදල ණයහිමියන්ට ගෙවීම සඳහා මේ දක්වාම සභාව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

1.3.4 අනුකූල නොවීම්

--------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | 2,301,213 | දේපළ මත හිඟ තක්සේරු බදු ගෙවීම් පැහැරහැරි පුද්ගලයන්ට සභාලේකම් විසින් වරෙන්තුවක් නිකුත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මුදල් රෙගුලාසි 571 | 283,625 | තුන් වර්ගයක කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් සභාව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | | |
| | (I) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | | සභා වාහන 03 ක ඉන්ධන දහනය වසර එකක් පුරාම සිදුකර නොතිබුණි |
| | (II) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 | | වාහන 09 ක දෛනික ධාවන සටහන් පසුව එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඈ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛ 2017 මාර්තු 17 දිනැති අංක පීඑස්/01/2017 | | නිලධාරීන් 05 ක් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 48,910,945 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,863,336 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 670,400 | - | 141,651 | 2,301,213 | 870,400 | - | 141,113 | 2,188,049 |
| (ii) කුලී | 22,765,680 | - | 14,471,906 | - | 25,685,900 | - | 17,106,478 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,764,000 | - | 1,630,247 | - | 1,457,400 | - | 1,312,200 | - |
| (iv)වෙනත් ආදායම් | 32,871,510 | - | 41,702,858 | 118,882,503 | 33,484,900 | - | 36,646,436 | 85,674,108 |
| එකතුව | 58,071,590 | - | 57,946,668 | 121,183,716 | 61,298,600 | - | 55,506,227 | 87,862,157 |

#### 2.2.2 වරිපනම් හා බදු

එකතුව රු.2,301,213 ක්වූ දේපළ මත හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර 01 සිට වසර 09 දක්වා කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

උසාවි දඩ රු.1,474,910 ක් සහ මුද්දර ගාස්තු රු.7,876,038 ක් උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

3.1 කාර්යසාධනය
------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත නිපැයුම් ඉටුකර ගැනීමට අසමත්වීම
---------------------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අරමුදලින් රු.2,999,724 ක පිරිවැයකින් මුතලායික්කුලි පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමය නිමකර තිබුණි. එසේවුවත්, ජලය ඇඹුල්රසවීම නිසා එම යෝජනා ක්‍රමයේ පානීය ජල සැපයුම් කටයුතු නවතා තිබුණි. ඒ අනුව පසුගිය වසර 03 පුරාම මෙම යෝජනා ක්‍රමය මඟින් අපේක්ෂිත නිමැයුම් මට්ටම ඉටුකරගත නොහැකිව තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I) දෛනික අපද්‍රව්‍ය රැස්කිරීම් කැබලිවලට කපා පස්දමා වසා නොතිබුණි.
(II) මදුරුවන් සහ කීටයන් පැතිරීම වැළැක්වීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරු තෙල් ඉසීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(III) ජාතික ප්‍රතිපත්තිවලට අනුව වෙන්කිරීම් නොකර, පරිසර හානි සිදුකරමින් ඝන අපද්‍රව්‍ය පුළුස්සා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

සභාවට අයත් පුස්තකාල හතරක පුස්තකාල සාමාජිකයන් 817 ක සාමාජිකත්ව වාර්ෂිකව අලුත් කිරීමට අසමත්වී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

සභාව විධිමත් අන්දමින් මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි මානව සම්පත් 15 ක් විසින් නිමකළ යුතු වැඩ ප්‍රමාදවී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) දේපළ යළි ඇගයීමට පසුගිය වසර 45 පුරාම සභාව අසමත්ව තිබුණි.
(ආ) සභාවේ සුසාන භූමි මුරකරුවන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණි. එසේ වුවද, සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා මේ දක්වාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරනය
---------------------------

3.5.1 වත්කම් හරදීමට අසමත්වීම
-----------------------------

පසුගිය වසර 07 සිට වසර 16 කාලයක පටන් සභාවට අයත් නොවූ ට්‍රැක්ටර් හයක් සභාව විසින් භාවිතා කර තිබුණි.

3.5.2 අක්‍රීය වත්කම්
---------------

කඩ්ඩායි පිහිටි පෙර පාසල පවත්වා නොමැති බැව් නිරීක්ෂණය විය. එනිසා එම පාසලේ ලී බඩු නඩත්තු කිරීමෙන් තොරව අක්‍රියව පැවතිණි. එනමුත්, පසුගිය වසර 04 පුරාම එම පාසල පැවැත්වීම සඳහා සභාව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5.3 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල
----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලයේදී පුස්තකාල පොත් 620 ක් භෞතික පරීක්ෂාව සඳහා ලබාගත නොහැකිවී තිබුණි. එනමුත් ඊට හේතු විගණනයට දන්වා නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය
-----------------------------

අයවැය පාලනය
------------------

අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර රු.1,961 සිට රු.12,345,771 හෙවත් සියයට 0.1 සිට සියයට 20 දක්වා සහ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.180,855 සිට රු.13,074,403 හෙවත් සියයට 13 සිට සියයට 21 දක්වා වූ පරාසවල විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධති | අඩුපාඩු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනය, පාඩු ලේඛනය, වීථි ලාම්පු ලේඛනය, මිණුම් පත්‍රිකා ලේඛනය, ඉඩම් විකුණුම්මත බදු ලේඛනය සහ වාහන ලොග් පොත් නඩත්තු කිරීමට අසමත් වීම |
| (ආ) | තොග | භාණ්ඩ වර්ග 11 ක් තොග ලේඛනයේ සටහන් කිරීමට අසමත්වීම. |